**බීඕසී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් ( පුද්ගලික) සමාගම - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

බීඕසී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති තොරතුරුවලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු

කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර,එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී. හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

### 1.5 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.5.1 ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සියළු බදුකරුවන් සමග ඇති බදු ගිවිසුම් අනුව,සෑම මසකම පළමු දිනයේදී කුලිය කල්ඇතිව ගෙවිය යුතුය.කෙසේ වෙතත්, 2023 දෙසැම්බර් 31 දිනට සමාගමේ ලැබිය යුතු වෙළඳ ශේෂය රු.12,146,196 ක් වන අතර ඉන් රු. 4,211,086 හෝ සියයට 34.67 ක් දින 90 කට වැඩි කාලයක් හිඟ ව ඇත. ඒ අනුව බදු ගිවිසුම්වල එකඟ වූ පරිදි වෙළඳ ආදායම් එකතු කරගැනීමට සමාගමට නොහැකි වී ඇති බව නිරීක්ෂණය විය. මුළු වෙළඳ ලැබිය යුතු අතරින් රු.12,062,854 හෙවත් සියයට 99.3 ක් කොල්ලුපිටිය මර්චන්ට් ටවර් ගොඩනැගිල්ලෙන්ද ඉතිරි සියයට 0.7 ක ශේෂය මහනුවර සී බැන්ක් නිවසින් ද වේ. වෙළඳ ලැබීම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ. | SLIIT City Uni පුද්ගලික සමාගම (රු.174,360), ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (රු.188,813) , සහ ඉන්ජිනියුටි පුද්ගලික සමාගම (රු.3,847,913) හැරුණු විට පහතින් දක්වා ඇති සියළු ලැබිය යුතු දෑ මුළුමනින් පියවා ඇත. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයෙන් සහ SLIIT City Uni පුද්ගලික සමාගමෙන් ලැබිය යුතු ශේෂ ඉන්ධන අර්බුදය තුල හඳුන්වා දුන් ඉන්ධන අධිභාර සඳහා වේ. ලැබිය යුතු දෑ පිළිබඳ විස්තර පහත පරිදි වේ.<br>කුලී - රු.3,501,844<br>ලැබිය යුතු රඳවා ගැනීමේ බදු (දෙසැ.) - රු.1,714,237<br>ප්‍රතිපූරණය කළ හැකි -රු.6,366,942 ( මේ අතරින් රු.6,160,492 ක් 2023.12.31 ඉන්වොයිස් ගත කළ ඒවා වේ.<br>විදුලිය අධිභාර -රු.363,173<br>වෙනත් -රු.200,000 | නියමිත කාලයට වෙළඳාමෙන් ලැබිය යුතු දෑ එකතු කර ගැනීමට අවශ්‍ය සියළු පියවර ගත යුතු බව නිර්දේශ කෙරේ. |

| විස්තරය | හිඟ ශේෂය (රු.) | | | | |
|---|---|---|---|---|---|
| | දින 1-30 | දින 31-60 | දින 61-90 | දින 90 ට වැඩි | එකතුව |
| **කුලී නිවැසියන් - මර්චන්ට් ටවර් කොල්ලුපිටිය** | | | | | |
| 1. ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී | 2,607,549 | - | - | - | 2,607,549 |
| 2.ලංකා බැංකුව- බස්නාහිර පළාත උතුර | 277,903 | - | - | - | 277,903 |
| 3. ලංකා බැංකුව- අධි ශ්‍රේණි ශාඛාව | 338,184 | - | - | - | 338,184 |
| 4. ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය | 2,033,651 | - | - | 188,813 | 2,222,464 |
| 5. SLIIT City Uni (පුද්ගලික) සමාගම | 1,677,065 | - | - | 174,360 | 1,851,425 |
| 6.ඉන්ජිනියුටි (පුද්ගලික) සමාගම | - | - | - | 3,847,913 | 3,847,913 |
| 7.ඩයලොග් එක්සියාටා පීඑල්සී | 105,689 | - | - | - | 105,689 |
| 8.මොබිටෙල් (පුද්ගලික ) සමාගම | 43,014 | - | - | - | 43,014 |

| | | | | | |
|---|---|---|---|---|---|
| 9.භාර්ටි (Bharti) එයාටෙල් ලංකා (පුද්ගලික ) සමාගම | 40,104 | 38,596 | - | - | 78,700 |
| 10.ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම | 553,629 | - | - | - | 553,629 |
| 11.ක්වෙස් (Quess) කෝර්ප් ලංකා (පුද්ගලික ) සමාගම | 103,676 | - | 853 | - | 104,529 |
| 12.බ්‍රානි (Brani's) ආපනශාලාව | 12,521 | 19,334 | - | - | 31,855 |
| **එකතුව මර්චන්ට් ටවර් (අ)** | **7,792,985** | **57,930** | **853** | **4,211,086** | **12,062,854** |
| **කුලී නිවැසියන්- සී බැන්ක් හවුස් මහනුවර** | | | | | |
| 1 ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී. | 24,035 | - | - | - | 24,035 |
| 2. කොළඹ කොටස් හුවමාරුව | 59,307 | - | - | - | 59,307 |
| **එකතුව සී බැන්ක් (ආ)** | **83,342** | **-** | **-** | **-** | **83,342** |
| **මුළු එකතුව (අ) + (ආ)** | **7,876,327** | **57,930** | **853** | **4,211,086** | **12,146,196** |

(ආ) ඉන්ජිනියුටි (පුද්ගලික ) සමාගමේ කුලී ගිවිසුම 2021 දෙසැම්බර් මාසයෙන් අවසන් වුවද. විගණන දිනය වන 2024 ජුනි 10 දින දක්වා වූ රු.3,847,913 ක හිඟ ශේෂය අයකරගෙන නොතිබුණි.

ඉන්ජිනියුටි (පුද්ගලික) සමාගමෙන් හිඟ අයකර ගැනීමට නීතිමය කටයුතු ආරම්භ කර ඇත.(නඩු අංක ඩීඑම්ආර් 1375/23- පිළිතුරු සඳහා අවසාන කැඳවීමේ දිනය 2024.06.14 සහ අනුකරණ සඳහා කැඳවීමේ දිනය 2024.10.18)

සමාගමට පාඩුවක් දැරීමකින් තොරව හිඟ ශේෂය අයකරගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු බව නිර්දේශ කෙරේ.

## 1.6 මුදල් කළමනාකරණය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) සමාගම සැමවිටම ඉහළ ජංගම වත්කම් තත්වයක් පවත්වාගෙන යන බවත් දිගු කාලීන ආයෝජන මත ලාභ ඉපයීම කෙරෙහි අවධානය යොමු නොකරන බවත් නිරීක්ෂණය විය. පහත වගුව අනුව 2019 සිට 2020 දක්වා මුළු වත්කම් වලට ජංගම වත්කම් ප්‍රතිශතය සියයට 60 සිට සියයට 64 දක්වා ක්‍රමයෙන් වැඩි වු අතර 2021 වර්ෂයේදී එය සියයට 43 දක්වා පහත වැටී තිබුණි. කෙසේ වෙතත් 2022 දී එය සියයට 50 දක්වා වැඩිවී තිබුණි. සමාලෝචිත වර්ෂය තුල දේපළ පිරියත සහ උපකරණ හා භාවිතයට අයිතිය ඇති වත්කම් අඩුවීම සහ තොග, ලැබිය යුතු සහ කෙටිකාලීන ආයෝජනවල සැලකිය යුතු වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් 2023 දී එය තවදුරටත් සියයට 54 දක්වා ඉහළ ගොස් තිබුණි. | වෙනත් ගොඩනැගිලි කළමනාකරණ ව්‍යාපෘතියක ආයෝජනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබාගෙන ඇත. | ද්‍රවශීලතාවය සහ ලාභදායිතාවය අතර සමබරතාවයක් පවත්වා ගැනීමට නිර්දේශ කෙරේ. |

| විස්තරය | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|
| මුළු වත්කම් (රු.000) | 2,350,447 | 2,169,300 | 2,112,041 | 2,050,868 | 1,927,314 |
| ජංගම වත්කම්(රු.000) | 1,257,796 | 1,075,678 | 901,564 | 1,310,738 | 1,155,591 |
| මුදල් හා මුදල් ආසන්න දෑ(රු.000) | 1,271 | 1,384 | 2,390 | 6,017 | 681 |
| වෙනත් ජංගම මූල්‍ය වත්කම්/කෙටි කාලීන ආයෝජන(රු.000) | 1,228,592 | 1,043,078 | 883,942 | 1,281,361 | 1,123,089 |
| ජංගම වත්කම් මුළු වත්කම්වල ප්‍රතිශතයක් ලෙස | 54 | 50 | 43 | 64 | 60 |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රුපියල් මිලියන 309 ක ලාභයක් වූ අතර, ඊට අනුරූපව පෙර වර්ෂයේ ලාභය රුපියල් මිලියන 279 ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රුපියල් මිලියන 30 ක වැඩිවීමක් නිරීක්ෂණය විය. මූල්‍ය ආදායම් සියයට 48 කින් වැඩිවීම සමාලෝචිත වර්ෂය තුල මූල්‍ය ප්‍රතිඵලයේ මෙම වැඩිවීමට ප්‍රධාන හේතු විය.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල ප්‍රවනතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමවල විශ්ලේෂණය පෙර වසරට සාපේක්ෂව වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමගින් පහත දක්වා ඇත.

| විස්තරය | විචලතාවයේ වටිනාකම වැඩිවීම/(අඩුවීම) (රු.) | විචලතාවය % | විචලනය සඳහා හේතුව |
|---|---|---|---|
| මූල්‍ය ආදායම් | 93,977,059 | 47.90 | -REPO ආයෝජන, ස්ථාවර තැන්පත් සහ ණයකර මත පොළී ආදායම වැඩිවීම |
| සෘජු වියදම් | 23,284,522 | 51.60 | - සහන මත වූ වෙනස හේතුවෙන් විදුලිය රු.18,796,621 කින් වැඩිවීම<br>- සාමාන්‍ය අළුත්වැඩියා, සේවා පිරිවැය වැඩිවීම, LED විදුලි බල්බ ආදේශ කිරීම හේතුවෙන් උපකරණ, විදුලි සවිකිරීම් සහ විදුලි ජනක නඩත්තු පිරිවැය රු. 2,035,216 කින් වැඩිවීම<br>- නාගරික වරිපනම් රු.926,799 කින් වැඩිවීම |
| පරිපාලන හා වෙනත් වියදම් | 12,474,351 | 95.13 | - 2022 ඔක්තෝබර් 01 දින සිට පැනවූ සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද රු.7,188,521 කින් වැඩිවීම<br>- අඩමාණ ණයගැතියන් සඳහා වෙන් කිරීම රු. 3,063,173 කින් වැඩිවීම<br>- මෙම වර්ෂයේ සමාගම රු. 563,173 ක් වෙන් කර තිබූ අතර, 2022 වර්ෂයේදී රු. මිලියන 2.5 කින් වෙන් කිරීම ආපසු හරවා තිබුණි. |
| ක්ෂය සහ ක්‍රමක්ෂය | 8,755,382 | 28.54 | - තක්සේරු කරන ලද නව ඵලදායී ජීවිත කාලය හා ස්ථාවර වත්කම්වල සුන්බුන් අගය සඳහා ප්‍රතිපාදනය හේතුවීම |
| උපදේශක ගාස්තු | 367,790 | 25.16 | - 2022 වර්ෂයේ නොතිබුණ කුලී අරමුණ සඳහා ලබාගත් රු. 230,000 ක අගය කිරීම ඇතුලත් වේ. |

## 2.3 අනුපාත විශ්ලේෂණය

විගණනය සඳහා ලබා දී ඇති මූල්‍ය ප්‍රකාශන සහ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සහ ඊට පෙර වසර 04 ක කාලසීමාව සඳහා සමාගමේ ඇතැම් වැදගත් අනුපාත පහත දැක්වේ.

| වර්ෂය | 2023 | 2022 | 2021 | 2020 | 2019 |
|---|---|---|---|---|---|
| ශුද්ධ ලාභ අනුපාතය (සියයට) | 70 | 74 | 64 | 71 | 66 |
| ජංගම අනුපාතය ( වාර ගණන) | 18.18 | 10.93 | 18.29 | 23.95 | 34.54 |
| මුළු වත්කම් මත ශුද්ධ ජංගම වත්කම් ( වාර ගණන) | 0.50 | 0.45 | 0.40 | 0.61 | 0.58 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | බදු කාලය ආරම්භවීමට පෙර බදු ගිවිසුම් අත්සන් කළ යුතුය. එසේ වුවද, 2023 වර්ෂය ඇතුලත නියමිත බදු කාලය ආරම්භවීමේ සිට මාස 03 කට පසු බදු ගිවිසුම් 04 ක් අත්සන් කර තිබුණි.<br><br>බදුකරුගේ නම — බදු ගිවිසුම් අංකය<br>01 භාර්ති (Bharti) එයාටෙල් ලංකා (පුද්ගලික ) සමාගම — 436<br>02 ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී — 386<br>03 ලංකා බැංකුව- අධිශ්‍රේණි ශාඛාව මහනුවර — 393<br>04 ක්වෙස් කෝප් ලංකා (පුද්ගලික ) සමාගම — 388 | තහවුරු කිරීම් ප්‍රමාදවීම, කුලී සංශෝධනය සහ බදුකරුගේ පාර්ශවයෙන් ඔවුන්ගේ අනුමැතීන් ප්‍රමාදවීම හේතුවෙන් බදු ගිවිසුම් ක්‍රියාත්මක කිරීම කල් ඉකුත් දින ඉක්මවා ගොස් තිබුණි. | බදු කාලය ආරම්භ වීමට පෙර බදු ගිවිසුම් අත්සන් කළ යුතු බව නිර්දේශ කෙරේ. |
| (ආ) | සියළු බදුකරුවන් සමග ඇති බදු ගිවිසුම් අනුව, සෑම මසකම පළමු දින සිට දින 14 කට පෙර මාසික කුලිය ගෙවීමට අපොහොසත් වුවහොත් මාසික කුලියට සියයට 20 ක දඩයක් බදුකරුගෙන් අය කෙරේ. සමහර අවස්ථාවලදී කුලීකරුවන් ගෙවීම් සිදුකිරීමට මාස 03 කට වැඩි කාලයක් ප්‍රමාද කළද ප්‍රමාද ගෙවීම් සඳහා ඔවුන්ගෙන් දඩ මුදලක් අයකර නොතිබුණි. බදුකරුවන් පිළිබඳ විස්තර පහත දැක්වේ.<br>• ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය<br>• SLIIT ඇකඩමි (පුද්ගලික ) සමාගම | දඩ පිළිබඳ වගන්ති සියළු බදු ගිවිසුම්වලට ඇතුලත් කර තිබුණද ආරම්භයේ සිට කුලීකරුවන්ගෙන් දඩ මුදල් අයකර නොමැත. | බදු ගිවිසුම්වල සඳහන් කර ඇති ප්‍රමාද බදු ගෙවීම් සඳහා දඩ මුදල් පැනවිය යුතු බවට නිර්දේශ කෙරේ. |